**සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල - 2019**

-----------------------------------------------------------------

## 1.1 මතය

------

සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරනය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මඟින් ස්ථාපිත මුදල් රෙගුලාසි 876(3) | ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වා ගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළ යුතු වුවද, අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු නොකර කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසි මාලාව අනුව මේ දක්වා එහි කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. | 2013 අංක 1 දරන දිවිනැගුම පනත අනුව සමෘද්ධි අධිකාරියේ ක්‍රියාත්මක කරන ලද අරමුදල් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදුන් බව, ඒ අනුව දිවිනැගුම පනතට අනුව ලොතරැයි අරමුදල ක්‍රියාත්මක කිරීමට දිවිනැගුම පනතින් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බව, මේ වන විට එය සමෘද්ධි පනත බවට පත්වී ඇති බව, කෙසේ වුවද අරමුදල ව්‍යවස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මඟින් ස්ථාපිත මුදල් රෙගුලාසි 877(1) | අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | අරමුදල ව්‍යාවස්ථාපිත කිරීම සඳහා අවශය නිති රෙගුලාසි මාලා පිළියෙල කිරිමෙන් අනතුරුව අයවැය ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කරන බව හා 2021 වර්ෂයේ සිට අයවැය ලේඛනය පිළියෙල කර ඇති බව. | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.466,554,238 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.175,229,171 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.291,325,067 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ලොතරැයි දායක මුදල් රු.320,069,530 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර්, 2019 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාසවල ලොතරැයි දිනුම්ලාභීන් 1,324 කට අදාළ චෙක්පත් ලබාදීම නතර කර රු.4,104,150 ක් වැයකර 2019 ජූලි 02 දින අරලියගහ මන්දිරය තුළ උත්සවයක් පවත්වා චෙක්පත් ලබාදීම සිදුකර තිබුණි. | 2019 වර්ෂයට පමණක් ආවේනික නොවූ මෙවැනි උත්සව අරලියගහ මන්දිරය, ජනාධිපති මන්දරිය, ඇන්දාන ක්‍රිඩාංගණය, කඩවත ස්වර්ණජෝති විද්‍යාලය, රත්නපුර ක්‍රිඩාංගණය, මාතර ක්‍රිඩාංගණය වැනි ස්ථානවල වර්ෂ කිහිපයක් එකතුකර ජයග්‍රාහී ප්‍රතිලාභින් සඳහා චෙක්පත් ප්‍රදාන උත්සව පවත්වා ඇතිඅ බව, මෙවැනි උත්සවයන් සංවිධානයේදී කෑමබීම, තේ වැනි සංග්‍රහ කටයුතු, ප්‍රවාහන වියදම්, වෙනත් උත්සව වියදම් වෙනුවෙන් නිවාස ලොතරැයි භාරකාර අරමුදලේ අනුමැතිය ලබාගනිමින් මෙම උත්සවය සංවිධානය කර ඇති බව හා එහිදී අනවශ්‍ය වියදම් කිසිවක් සිදුවී නොමැති බව. | අත්‍යාවශ්‍ය නොවන මෙවැනි වියදම් අවමකර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ලොතරැයි දිනුම්ලාභීන් 128 දෙනෙකුට හිමි ත්‍යාග මුදල වූ රු.25,600,000 ක් ප්‍රතිලාභියා මියයාම, ත්‍යාගලාභියා සහනාධාරලාභියකු නොවීම, විදේශගතවීම, තොරතුරු සොයාගත නොහැකිවීම, පදිංචිය හැරයාම, එක්වරක් දිනුම් ලබාගත් ප්‍රතිලාභීන් නැවත දිනුම් ඇදීම සඳහා නිශ්චිත කාලපරිච්ඡේදයකට නවතා තැබීමේ ක්‍රමවේදයක් වශයෙන් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා දත්ත පද්ධතිය තුළින් ප්‍රතිලාභීන්ගේ නම් ඉවත් කිරීමට කටයුතු නොකිරීම යනාදී විවිධ හේතු මත දිස්ත්‍රික් කාර්යාලවලින් ත්‍යාග මුදල් ආපසු එවා තිබුණි. මේ අනුව සමෘද්ධිලාභීන් සැලකිය යුතු සංඛ්‍යාවකට දිනුම් අවස්ථාව අහිමිවීම තුළින් අරමුදලේ දැක්ම හා පරමාර්ථ කෙරෙහි ළඟාවීමට නොහැකිවී තිබුණි. | දිනුම් ඇදීම සිදු කළද දත්ත පද්ධතිය තුළ නිවැරදි කිරීමට ගතවන කාලය අනුව මෙවැනි තත්ත්වයක් ඇතිවිය හැකි බව, නමුත් මෙම මුදල් අනිසි ලෙස වියදම් නොකරන බව, ඉතිරිවන සියළුම මුදල් ගිණුමට බැර කරන බව, මෙසේ ඉතිරිවන මුදල් විශේෂ නිවාස වැඩසටහනක් සඳහා යොදවා ඇති බව, ඒ අනුව අරමුදලේ දැක්ම හා පරමාර්ථවලට අනුකූලව කටයුතු කර ඇති බව හා මේ වනවිට දත්ත පද්ධතිය මාසිකව නිවැරදි කිරීම තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදු කරනු ඇත. | පවත්නා පද්ධතියට අනුකූළ විය යුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ අංක 17 දරන රෙගුලාසිය ප්‍රකාරව සෑම දිනුම් ඇදීමක් සිදු කිරීමට පෙර ඒ ඒ මාසයේ සමෘද්ධි සහනාධාරයෙන් ඉවත්වූ සහ නව සහනාධාරලාභීන්ගේ තොරතුරු පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 08 කදී ත්‍යාගලාභීන් 837 කට හිමි රු. 154,150,000 ක ත්‍යාග මුදලක් ප්‍රදානය කිරීමට නොහැකිවී තිබුණි. | 2020 න් පසු මෙම තත්වය අවම කර ඇති බව හා මේ වන විට නිවැරදි දත්ත පද්ධතියක් සකස් කර දිනුම් ඇදීම සිදු කරන බව. | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. |
| (ඇ) | දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ අංක 8 දරන රෙගුලාසිය ප්‍රකාරව ජයග්‍රාහී ප්‍රතිලාභීන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා සුදුසු ව්‍යාපෘතිවලට යොමු කිරීම අරමුදලේ පරමාර්ථයක් වුවද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ රෙගුලාසි මාලාවට අනුව අරමුදලේ සියළු පරමාර්ථ එකවර සම්පූර්ණ කළ නොහැකි බව, ඒ අනුව වසරකට නිවාස 2,000 කට වැඩි ප්‍රමාණයක් සහනාධාරලාභීන් හා අඩු ආදායම්ලාභීන්ට ලබා දෙමින් පවතින බව හා අරමුදලේ පරමාර්ථ සම්පූර්ණවී ඇති බව. | ලොතරැයි අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 අරමුණුවලට පටහැනිව අරමුදල් උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශේෂ අවධානය යොමු කළ යුතු අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම වෙනුවෙන් සමෘද්ධිලාභීන්ගේ මාසික දායකත්වයෙන් ගොඩනැගී ඇති මෙම අරමුදලින් සමෘද්ධිලාභීන් නොවන පුද්ගලයින් 283 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 56,600,000 ක් වැය කර තිබුණි. | සමෘද්ධිලාභීන්ටත් වඩා අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ඉතාම දිළිඳු තත්ත්වයේ පවතින බව දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, ප්‍රාදේශීය ලේකම්වරුන් වාර්තා කර ඇති බව, එම වාර්තාව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, ප්‍රාදේශීය ලේකම්, මූලස්ථාන/කලාප/ බැංකු කළමනාකරුවන් හා වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් තොරතුරු නිවැරදි බවට සහතික කර නිවසක් ලබාදීම සුදුසු බව නිර්දේශ කර ඇති බව, ඒ අනුව මෙම නිවාස ලබාදීමේදී රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිලාභීන්ගේ සමාජ ආරක්ෂණ තත්ත්වය දියුණුවනු දැකිය හැකි බව හා මෙම ක්‍රියාදාමයෙන් පිටස්තරව අනුමැතියෙන් තොරව කිසිදු නිවසක් ලබාදී නැති බව. | ලොතරැයි අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පමණක් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුත්තලම දිස්ත්‍රික්කයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නඟුල් එළිය ගම්මානයේ අඩු ආදායම්ලාභී ධීවර පවුල් 26 ක් සඳහා ක්‍රියාත්මක කර තිබුණු “සමෘද්ධි නිවාස වාසනා” වැඩසටහන සඳහා අරමුදලේ රෙගුලාසි මාලාවෙන් බැහැරව 2017 සහ 2018 වර්ෂවලදී එකතුව රු.18,688,000 ක් ගෙවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී විෂයභාර අමාත්‍යවරයාගේ සහභාගීත්වයෙන් පැවති ආරම්භ කිරීමේ උත්සවය සඳහා රු.241,625 ක් වැයකර තිබුණි. | මාසිකව නිවාස ලොතරැයි දිනුම් ඇදීමට අදාළ ත්‍යාග ලබාදෙන අතර මීට අමතරව ඉතිරිවන යම් මුදලක් වේ නම් මෙවැනි නිවාස ඉදිකිරීමේ කටයුතු සඳහා ලබාගැනීමට නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලය විසින් තීරණය කර ඇති බව, මෙහිදී අරමුදලට කිසිදු හානියක් නොවන බව, කිසිදු ආකාරයකින් මුදල් අවභාවිතයක් නොවන බව, පරමාර්ථ අනුව සමෘද්ධිලාභින්ට මෙන්ම අඩු ආදායම්ලාභින්ටද නිවසක් හිමිවන බව, බොහෝ අවස්ථාවල මෙම අඩු ආදායම්ලාභින් සහනාධාර පොරොත්තු ලේඛනවල සිටින පිරිසක් වන බව, සහනාධාර මඟින් 26 දෙනෙකුට ලබාදීමට නොහැකි හෙයින් මෙම පිරිස අඩු ආදායම්ලාභින්ගේ ගණයට ගෙන ඇති බව, අරමුදලේ අනුමැතිය මත උත්සව වියදම් වැයකර ඇති බව හා මූලික අවශ්‍යතා හැර අනවශ්‍ය වියදම් වෙනුවෙන් මුදල් වැය කර නැති බව. | -එම- |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2022 මැයි 17 දින ඉදිරිපත් කර තිබුණි. | 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් අනතුරුව ඊට පසුව එක් එක් වර්ෂවල මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී පූර්ව වර්ෂයේ සංශෝධනයන් සහිතව සකස් කොට විගණනය සඳහා ඉදිරිපත් කළ බව හා 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් අනතුරුව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම නිසා කාල පමාව සිදුවූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.2 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී අරමුදලට අදාළ විගණන නිරීක්ෂණ සාකච්ඡාවට භාජනය කර නොතිබුණි. | ඉදිරියේදී නිරීක්ෂණයේ සඳහන් පරිදි මෙම අරමුදලට අදාළ විගණන නිරීක්ෂණයන් සම්බන්ධව සාකච්ඡාවට ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්වා බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |